# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/37 - 2023 ජනවාරි මස 04 වැනි බදාදා - 2023.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/92 (III)

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත**

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 34 වන සහ 44 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 64 වන වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**ඉසෙඩ්. ඒ. නසීර් අහමඩ්,**
පරිසර අමාත්‍ය.

2023 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

කලින් කල සංශෝධිත පරිදි වූ, 1993 නොවැම්බර් මස 26 වන දින අංක 794/23 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරනු ලැබූ 1993 අංක 1 දරන පතල් කැනීම් (බලපත්‍ර දීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) 4 වන නියෝගයේ (9) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(9) (අ) කාර්යාංශය විසින්, 2.1 වන ආකෘති පත්‍රයේ දක්වා ඇති තොරතුරු සහ ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු, (1) වන ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.

(ආ) කාර්යාංශය විසින් ඉල්ලුම්පත්‍රයක් අනුමත කරනු ලැබූ, සහ -

(i) සමස්ථ ගවේෂණ වැඩසටහන සඳහා වන මූල්‍ය ආයෝජනය ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පත් කළ බවට වන සාක්ෂි ඉල්ලුම්කරු විසින් සපයනු ලබන අවස්ථාවක, කාර්යාංශය විසින් ඉල්ලුම්කරු වෙත ගවේෂණ බලපත්‍රයක් නිකුත්කර ඉල්ලුම්කරු ගවේෂණ බලපත්‍රලාභියකු ලෙස කාර්යාංශයේ නිල බලපත්‍ර පාලන පද්ධතියේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය ;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) මූල්‍ය ආයෝජන තැන්පත් කළ බවට වන සාක්ෂි සැපයීමට ඉල්ලුම්කරුට කාලය අවශ්‍ය වන්නා වූ අවස්ථාවක, කාර්යාංශය විසින්, මාස තුනක කාලසීමාවක් සඳහා මූලික කොන්දේසි සහිත ගවේෂණ බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි අතර, සමස්ථ ගවේෂණ වැඩසටහන සඳහා වන මූල්‍ය ආයෝජනය ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පත් කළ බවට වන සාක්ෂි ඉල්ලුම්කරු විසින් සපයනු ලබන විට, කාර්යාංශය විසින්, මූලික කොන්දේසි සහිත ගවේෂණ බලපත්‍රය ගවේෂණ බලපත්‍රයක් බවට පත්කර එය උපරිම වශයෙන් වසර දෙකක කාලසීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය යුතුය.

(ඇ) කාර්යාංශය විසින් නිකුත් කරන ලද එවැනි යම් බලපත්‍රයක් එකී බලපත්‍රයේ දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, එකී බලපත්‍රය එහි කාලය අවසන් වන දින සිට වරකට එක් වසර බැගින්, උපරිම වශයෙන් වසර තුනක කාලසීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකිය.

(ඈ) (1) වන ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, කාර්යාංශය විසින්, එකී ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු අතර, ඉල්ලුම්කරු විසින්, පනතේ 39 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට කාර්යාංශයේ එකී තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ඉ) කාර්යාංශය විසින් ඉල්ලුම්කරුවෙකු වෙත ගවේෂණ බලපත්‍රයක් නිකුත් කර තිබුණ ද, එකී බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් භූමි ප්‍රදේශයක් සඳහා ද, එම භූමි ප්‍රදේශය ඇතුළත පිහිටි පෞද්ගලික ඉඩමක හිමිකරු විසින්, එම ග්‍රිඩ් ඒකකය සඳහාම තුන්වන පාර්ශවයක් වෙත වලංගු ගවේෂණ බලපත්‍රයක් ප්‍රදානය කර තිබීම නොසලකා, යටත් පිරිසෙයින්, අවම ග්‍රිඩ් ඒකක ප්‍රමාණයකට සමාන වූ ගෙවීමක් සමග 2.1 වන ආකෘති පත්‍රයට සාරානුකූලව ඔහුගේ ඉඩම ගවේෂණය කිරීම සඳහා කාර්යාංශය වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.'';

(2) 4 වන නියෝගයේ (10) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''(10) ගවේෂණ බලපත්‍රයක් දරන්නෙකු විසින් III වන කොටසේ නිශ්චිතව දක්වා ඇති කාර්මික කටයුතු ඉටු කරනු ලැබිය යුතු යඃ නැතහොත් ඉටු කිරීමට සලස්වනු ලැබිය යුතු ය. එකී සියලු කාර්මික කටයුතු ලේඛනගත කර එකී බලපත්‍රයේ කාලය ඉකුත් වන දිනට පෙර අනුමතය සඳහා කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉටු කරන ලද පිළිගත හැකි කාර්මික කටයුතුවල වාර්ෂික හෝ අවම වටිනාකම පහත දැක්වෙන පරිදි විය යුතු යඃ-

මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ප්‍රදේශ ගවේෂණය කිරීම සඳහා

| කාල සීමාව | වර්ෂයකට වර්ග කිලෝමීටරයක් සඳහා වන වටිනාකම (රු.) |
|---|---|
| 1 වන වසර සහ 2 වන වසර | 1000,000.00 |
| 1 වන අලුත් කිරීම - 3 වන වසර | 1,500,000.00 |
| 2 වන අලුත් කිරීම - 4 වන වසර | 2,000,000.00 |
| 3 වන අලුත් කිරීම - 5 වන වසර | 2,000,000.00 |

(3) 4 වන නියෝගයේ (13) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

''(14) (අ) ගවේෂණ බලපත්‍රයක් පැවරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක්, ඉල්ලුම්කරුවකු විසින් පෞද්ගලිකව ම හෝ ඔහුගේ බලයලත් අනුයෝජිතයා විසින් 35 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම්පත්‍ර ගාස්තුව ද සමග 2.4 වන ආකෘති පත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු ය. ගවේෂණ බලපත්‍රයක් පැවරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, එකී ගවේෂණ බලපත්‍රය නිකුත් කළ දින සිට මාස හයක කාලසීමාවක් අවසන් වීමෙන් පසුව පමණක් කාර්යාංශය විසින් භාරගනු ලැබිය යුතු ය.

(ආ) කාර්යාංශය විසින්, ගවේෂණ බලපත්‍රයක් පැවරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් පසු දින දාහතරක් ඇතුළත, එකී පැවරීම සිදු කරන අවස්ථාවේ දී පැවරුම්කරු විසින් සිදුකොට ඇති වැඩවල ප්‍රතිඵලය ද ඇතුළුව, එකී පැවරුම්ලාභියා විසින් ඉටු කිරීමට අපේක්ෂිත ගවේෂණ කටයුතු සම්බන්ධයෙන් සවිස්තර ඉදිරිපත් කිරීමක් කාර්යාංශය වෙත සිදු කරන ලෙස එකී පැවරුම්ලාභියාට නියම කරනු ලැබිය යුතු ය.

(ඈ) පැවරුම්ලාභියා විසින් සිදුකරන ලද ඉදිරිපත් කිරීමෙන් යෝජිත ගවේෂණ කටයුතු පිළිගත හැකි වන්නා වූ ද බලපත්‍රයේ වලංගු කාලසීමාවෙන් ඉතිරිව පවතින කාලසීමාව දක්වා යෝජිත ගවේෂණ කටයුතු දිගටම කරගෙන යා යුතු බවට කාර්යාංශය විසින් නිර්දේශ කරනු ලබන්නේ නම් ද, කාර්යාංශය විසින්, එම ගවේෂණ බලපත්‍රය පැවරීමේ සාධන පත්‍රය අනුමත කරනු ලැබිය යුතුය.

(ඈ) පැවරීමේ සාධන පත්‍රය කාර්යාංශය විසින් අනුමත කර කාර්යාංශයේ නිල බලපත්‍ර පාලන පද්ධතියේ ගවේෂණ බලපත්‍රලාභියා ලෙස පැවරුම්ලාභියාගේ නම ලියාපදිංචි කළ විට, එම බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති අයිතිවාසිකම් සහ වගකීම් ද ඇතුළුව එකී කොන්දේසි එම ගවේෂණ බලපත්‍රලාභියා සඳහා අදාළ විය යුතු ය. බලපත්‍රයේ කොන්දේසි සහ ඊට අදාළ අනෙකුත් නියමයන්, කාර්යාංශයේ අනුමතය ඇතිව, පැවරීම සිදුකරන අවස්ථාවක දී වෙනස් කළ හැකි ය.

(ඉ) බලපත්‍රලාභියා විසින් ගවේෂණය අවසන් කළ දින සිට වසර දෙකක් ඇතුළත හෝ ගවේෂණ බලපත්‍රයේ කාලය ඉකුත් වූ විට, පතල් කැණීම් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය. එවැනි අවස්ථාවක, පතල් කැණීම් බලපත්‍රයේ ඉල්ලුම්කරු විසින්, කාර්යාංශය විසින් අනුමත කරන ලද සමස්ථ යෝජිත ව්‍යාපෘති වැඩසටහනෙන්, යටත් පිරිසෙයින්, 20%ක් වන මූල්‍ය ආයෝජනයක් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පත් කර ඇති බවට වන සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. බලපත්‍රලාභියා විසින් අදාල ගාස්තුව ද සමග එකී විභව ප්‍රදේශය තමා වෙත රඳවා ගැනීම සඳහා ඉල්ලීමක් කර ඇති අවස්ථාවක, කාර්යාංශය විසින්, එසේ රඳවා ගනු ලබන කාලසීමාව තුළ වෙනත් යම් ගවේෂණ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයක් සලකා නොබැලිය යුතු ය.

(4) 32 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''32. (1) ගවේෂණ, පතල් කැණීම්, වෙළඳ හෝ අපනයන බලපත්‍රයක් යටතේ කැණීම් කරනු ලබන, පිරිසැකසුම් කරනු ලබන, විකුණනු ලබන, අපනයනය කරනු ලබන හෝ අන්‍යාකාරයකින් අත්කර ගනු ලබන සියලු ඛනිජ ද්‍රව්‍ය සඳහා -

(අ) ප්‍රගමන ගවේෂණ වැඩසටහනක් හා සම්බන්ධ වී කාර්යාංශයේ අනුමතය ඇතිව ඛනිජ ද්‍රව්‍ය ඉවත් කරන, ගවේෂණ බලපත්‍රයක් දරන්නකුගෙන්;

(ආ) ඛනිජ ද්‍රව්‍ය සඳහා කැණීම් කරන හෝ විකිණීමට පෙර ඛනිජ ද්‍රව්‍ය පිරිසැකසුම් කරන හෝ එම ඛනිජ ද්‍රව්‍ය අර්ධ වශයෙන් නිම කළ නැතහොත් නිම කළ නිෂ්පාදන බවට බද්ධ කරන හෝ පරිවර්තනය කරන හෝ එම ඛනිජ ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගන්නා හෝ ඒවා අපනයනය කරන, පතල් කැණීම් බලපත්‍රයක් දරන්නකුගෙන්;

(ඇ) පතල් කැණීමේ බලපත්‍රයක් හෝ වෙළඳ බලපත්‍රයක් දරන්නකුගෙන් පිරිසැකසුම් නොකළ ඛනිජ ද්‍රව්‍ය මිලට ගෙන එම ඛනිජ ද්‍රව්‍ය නැවත විකිණීමට හෝ අපනයනය කිරීමට පෙර පිරිසැකසුම් කරන හෝ පිරිසැකසුම් කළ හෝ පිරිසැකසුම් නොකළ ඛනිජ ද්‍රව්‍ය අපනයනය කරන, වෙළඳ බලපත්‍රයක් දරන්නකුගෙන්,

රාජ්‍යභාග ඉල්ලා සිටීම, ලබා ගැනීම සහ අයකර ගැනීම සඳහා කාර්යාංශයට බලය තිබිය යුතුය.

(2) (1) වන ජේදයේ සඳහන් සෑම බලපත්‍ර දරන්නකු විසින් ම, පතලකින් ලබාගත් ඛනිජ ද්‍රව්‍ය පිළිබඳව පහත දැක්වෙන කරුණු ඇතුළත් නිශ්චිත ගිණුම් පොත් තබා ගනු ලැබිය යුතු ය.

(අ) සියලු ඛණිජ ද්‍රව්‍ය කැණීම් කටයුතු පිළිබඳව, පතලෙන් ලබාගත් ද්‍රව්‍ය ප්‍රමාණ දැක්වෙන කාලක්‍රමානුගත වාර්තාවක්;

(ආ) මෝල්වලින් හෝ වෙනත් පිරිසැකසුම් යන්ත්‍රෝපකරණ ඇති ස්ථානවලින් ලබාගත් විකුණුම් වාර්තා හෝ වෙළඳ බලපත්‍ර දරන්නන්ගේ ණයවර ලිපි හෝ ටෙලිගැෆික් පැවරුම් පිළිබඳ විස්තර;

(ඇ) ගෙවිය යුතු රාජ්‍යභාග මුදල් ප්‍රමාණය නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් සියලු සිද්ධිමය සහ අවස්ථානුගත කරුණු; හෝ

(ඈ) සංචිත පිළිබඳ තක්සේරුව.''.

(5) ඒ නියෝගවල 33 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''33. (1) 1.2, 3.2, 3.3, 4.2, 5.2, 6, 11, 13 සහ 14 වන ආකෘති පත්‍රවල නිශ්චිතව දක්වා ඇති පරිදි, රාජ්‍ය භාග ලෙස ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගණනය කිරීමේ සහ ගෙවීමේ කාර්යය සඳහා, යම් කාලසීමාවක් තුළ පතලක නිෂ්පාදන ප්‍රමාණයේ වටිනාකම -

(අ) විකුණුම් වාර්තාවලට අනුව නිශ්චය කරන ලද නිෂ්පාදන ප්‍රමාණයේ නියම වෙළඳපොල වටිනාකම; හෝ

(ආ) නියම වෙළඳපොල වටිනාකම නිශ්චය කර ගැනීමට පැහැදිලි ක්‍රමයක් නොමැති අවස්ථාවක හෝ ස්ථාපිත වෙළඳපොල වටිනාකමක් නොමැති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ නිෂ්පාදන ප්‍රමාණයේ වටිනාකමින්, 14 වන ආකෘති පත්‍රයෙන් අවසර දී ඇති ප්‍රමාණානුකූල අඩුකිරීම්වලින් පසු ඉතිරි වටිනාකම,

විය යුතු ය.

(2) (අ) 32 වන නියෝගයේ (1) වන ජේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි රාජ්‍යභාග ගෙවීමට යටත් බලපත්‍රලාභියෙකු හෝ අපනයනකරුවකු විසින්, ඒ සඳහා ඔහුට බලපත්‍රයක් නිකුත් කිරීමට පෙරාතුව, එම බලපත්‍රය යටතේ ගෙවිය යුතු රාජ්‍යභාග සඳහා කාර්යාංශය විසින් නිශ්චය කරනු ලබන "රාජ්‍ය භාග අත්තිකාරම් ගෙවීමක්'' කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, කාර්යාංශය විසින්, එම බලපත්‍ර යටතේ ගෙවිය යුතු රාජ්‍යභාග සඳහා වන "රාජ්‍යභාග අත්තිකාරම් ගෙවීම්" මුදල් ප්‍රමාණය නිශ්චය කරනු ලැබිය යුතු ය.

(ආ) පතල් කැණීම්, වෙළඳ, අපනයන හෝ කාර්යාංශයේ විශේෂ අවසරය ඇතිව ඛනිජ ද්‍රව්‍ය අපනයනය කරන ගවේෂණ බලපත්‍ර දරන්නන් විසින්, ගණනය කරන ලද රාජ්‍යභාග ගෙවීම් ද සමග 14 වන ආකෘතිපත්‍රයට සාරානුකූල සවිස්තර ත්‍රෛමාසික වාර්තාවක් ලබා දිය යුතු ය. එකී ත්‍රෛමාසික රාජ්‍යභාග පහත දැක්වෙන ආකාරයට කාර්යාංශයට ගෙවිය යුතු යඃ-

| *කාර්තුව* | *අවසන් වන දිනය* | *ගෙවීම් සිදු කළ යුත්තේ කවර දින ද, කවර දිනට පෙර ද යන්න* |
|---|---|---|
| පළමු වන | මාර්තු මස 31 වන දින | අප්‍රේල් මස 30 වන දින |
| දෙවන | ජූනි මස 30 වන දින | ජූලි මස 31 වන දින |
| තෙවන | සැප්තැම්බර් මස 30 වන දින | ඔක්තෝබර් මස 31 වන දින |
| සිව්වන | දෙසැම්බර් මස 31 වන දින | ජනවාරි මස 31 වන දින (එළඹෙන වර්ෂයේ) |

(ඇ) ත්‍රෛමාසික රාජ්‍ය භාග මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ; එකී රාජ්‍ය භාග මුදල් ප්‍රමාණය, ගෙවිය යුතු රාජ්‍ය භාගයෙන් සියයට විස්සකට සමාන දඩයකට යටත් විය යුතු අතර, එය (ආ) ජේදයේ නිශ්චිතව දක්වා ඇති නියමිත දින සිට මාස දෙකක කාලසීමාවක් තුළ ගෙවිය යුතුය.

(3) (අ) මේ නියෝගයේ පටහැනිව කුමක් සඳහන් වුව ද, (2) වන ජේදයේ (ඇ) අනුජේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ එකී පැහැර හැර ඇති රාජ්‍ය භාග මුදල් ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් ගෙවා නොමැති අවස්ථාවක, කාර්යාංශය විසින්, ස්වකීය අභිමතය පරිදි මාස තුනක කාලසීමාවක් සඳහා බලපත්‍රය අත්හිටවනු ලැබිය හැකි ය.

(ආ) (2) වන ජේදයේ (ඇ) අනුජේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ එකී පැහැර හැර ඇති රාජ්‍ය භාග මුදල් ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් ගෙවා නොමැති අවස්ථාවක, කාර්යාංශය විසින්, ස්වකීය අභිමතය පරිදි එකී බලපත්‍රය අවලංගු කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

(4) ඛනිජ ද්‍රව්‍ය ආයෝජන ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇත්නම් මිස, විකුණුම්වලින් හෝ පතල් නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳව නිශ්චය කරන ලද වෙළඳපොල වටිනාකම අනුව හෝ අය කරන රාජ්‍යභාගය එම වටිනාකම්වලින් පහත දැක්වෙන ප්‍රතිශතයක් විය යුතු යඃ-

| | |
|---|---|
| වටිනා ලෝහ (අපනයන නොකරන)<br>වටිනා ලෝහ (අපනයනික) | සියයට 15 යි |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයනය නොකරන) | සියයට 7 යි |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයනික) | සියයට 9 යි |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | කාර්යාංශය විසින් වාර්ෂිකව නිශ්චය කරනු ලබන ස්ථාවර ඒකකයක මිල. |
| විසිතුරු ගල් (අපනයනය නොකරන) | සියයට 7 යි |
| විසිතුරු ගල් ( අපනයනික) | සියයට 9 යි |
| පදනම් ලෝහ සහ වෙනත් ලෝහ (අපනයනය නොකරන) | සියයට 7 යි |
| පදනම් ලෝහ සහ වෙනත් ලෝහ (අපනයනික) | සියයට 9 යි |

(5) කාර්යාංශය විසින්, ආයෝජන ගිවිසුම් රාමුව තුළ පතල් නිෂ්පාදන ප්‍රමාණයේ වටිනාකම, රාජ්‍ය භාග ප්‍රතිශතය, ඉඩදිය හැකි අඩු කිරීම් සහ රාජ්‍ය භාග මුදල් ගෙවීමේ වැඩපිළිවෙල නිශ්චය කරනු ලැබිය හැකි ය.

(6) කාර්යාංශය විසින් තීරණය කරනු ලබන ඒකක හෝ වෙළඳ වටිනාකම සෑම වර්ෂයක දී ම *ගැසට්* පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) 35 වන නියෝගයේ (1) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"35. (1) පනතේ 44 වන වගන්තිය ප්‍රකාර ගෙවිය යුතු ගාස්තු පහත දැක්වෙන ආකාරයට ගණනය කළ යුතු යː-

ශිල්පීය කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීම හා අලුත් කිරීම ː

| | |
|---|---|
| "අ" වර්ගය | හෙක්ටයාරයක් සඳහා වසරකට රු. 5,000 |
| "ආ" වර්ගය | හෙක්ටයාරයක් සඳහා වසරකට රු. 2,000 |

කාර්මික පතල් කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීම සහ අලුත් කිරීම ː

| | |
|---|---|
| "අ" වර්ගය | හෙක්ටයාරයක් සඳහා වසරකට රු. 50,000 |
| "ආ" වර්ගය | හෙක්ටයාරයක් සඳහා වසරකට රු. 30,000 |
| "ඇ" වර්ගය | හෙක්ටයාරයක් සඳහා වසරකට රු. 10,000 |
| "ඈ" වර්ගය | හෙක්ටයාරයක් සඳහා වසරකට රු. 5,000 |

| | |
|---|---|
| අක්වෙරළ මුහුදු වැලි සඳහා වන ලියාපදිංචි ගාස්තුව කැණීම් බලපත්‍ර ලියාපදිංචි ගාස්තුවෙන් 50% ක් වේ. | |
| ගවේෂණ බලපත්‍රයක් නිකුත් කිරීම: | වසරකට/මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ප්‍රදේශයකට/ඛනිජ ද්‍රව්‍යයකට රු. 100,000 |
| ගවේෂණ බලපත්‍රයක් අලුත් කිරීම | |
| පළමුවන අලුත් කිරීම (2 වන වසර අවසානයේ ) | වසරකට/ මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ප්‍රදේශයකට/ඛනිජ ද්‍රව්‍යයකට රු. 100,000 |
| දෙවන අලුත් කිරීම (3 වන වසර අවසානයේ ) | වසරකට/ මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ප්‍රදේශයකට/ඛනිජ ද්‍රව්‍යයකට රු. 125,000 |
| තෙවන අලුත් කිරීම (4 වන වසර අවසානයේ ) | වසරකට/ මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ප්‍රදේශයකට/ඛනිජ ද්‍රව්‍යයකට රු. 150,000 |
| ආරක්ෂිත ඛනිජ කැණීම් බලපත්‍රයක් නිකුත් කිරීම සහ වාර්ෂිකව අලුත් කිරීම | හෙක්ටයාරයකට රු. 10,000 |
| වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සහ අලුත් කිරීම: | |
| "අ" වර්ගය | රු. 15,000 } වසරකට |
| "ආ" වර්ගය | රු. 8,000 } වසරකට |
| "ඇ" වර්ගය | රු. 2,000 } වසරකට |
| ප්‍රවාහන බලපත්‍රයක් නිකුත් කිරීම | රු. 250 |
| අපනයන බලපත්‍රයක් නිකුත් කිරීම | රු. 7,500 |
| පතල් කැණීම් බලපත්‍රයක හිමිකම පැවරීම | රු. 100,000 |
| ඛනිජ ද්‍රව්‍යවල හිමිකමට අදාළ යම් ලේඛනයක් පරීක්ෂා කිරීම | රු. 1,000 |
| යම් බලපත්‍රයක් හෝ වෙනත් ලේඛනයක සහතික කළ පිටපතක් ලබා ගැනීම | රු. 1,000 } පිටුවකට |
| ලයිස්තුගත නොකළ විවිධ සේවා | එක් එක් අවස්ථාව සඳහා නියම කරනු ලැබිය හැකි මුදලක් |
| ගවේෂණ බලපත්‍රයක හිමිකම පැවරීම | මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ප්‍රදේශයකට රු 100,000 |
| රඳවා තබා ගැනීමේ ගාස්තුව | වසරකට/ මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ප්‍රදේශයකට / ඛනිජ ද්‍රව්‍යකට රු. 200,000 |

| | |
|---|---|
| ඛනිජ ආශ්‍රිත විසිතුරු භාණ්ඩ සාම්පලයක් විදේශ රටකට යැවීම සඳහා වන අවසර ලිපියක් ලබා ගැනීම | රු. 5,000/- |
| ඛනිජ ද්‍රව්‍ය සාම්පලයක් විදේශ රටකට යැවීම සඳහා වන අවසර ලිපියක් ලබා ගැනීම | රු. 5,000/- |
| ගවේෂණය සඳහා වන ආපසු නොගෙවන සැකසුම් ගාස්තුව (එක් ඉල්ලීමක් සඳහා) | රු. 10,000/- |

(7) 2.1, 2.2 සහ 9 වන ආකෘති පත්‍ර ඉවත් කර ඒ වෙනුවට පිළිවෙලින් පහත දැක්වෙන ආකෘති පත්‍ර ආදේශ කිරීමෙන්:-

**(4(1) නියෝගය)**
**2.1 වන ආකෘති පත්‍රය**

**ගවේෂණ බලපත්‍රය**

**ඉල්ලුම්පත්‍රය**

1. ඉල්ලුම්කරු පිළිබඳ විස්තර :

(අ) තනි පුද්ගලයකු සඳහා :

(i) සම්පූර්ණ නම :
(ii) ජාතික හැඳුනුම්පත් අංකය :
(iii) ජාතිය :
(iv) උපන් දිනය සහ වයස :
(v) ලිපිනය :
(vi) දුරකථන අංකය :

(අ) ස්ථාවර -
(ආ) ජංගම -
(ඇ) ෆැක්ස් -

(vii) විද්‍යුත් තැපැල් ලිපිනය :
(viii) වෘත්තිය :
(ix) රැකියාවක නියුතු නම් රැකියාවේ යෙදෙන තනතුර :
(x) සේවායෝජකයාගේ නම :
(xi) ලිපිනය :
(xii) දුරකථන අංකය :

(අ) ස්ථාවර -
(ආ) ජංගම -
(ඇ) ෆැක්ස් -

(xiii) විද්‍යුත් තැපැල :
(xiv) යෝජිත ගවේෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන මූල්‍යමය හැකියාව ඔප්පු කරන සාක්ෂි (අමුණන්න)

පසුගිය මාස 6ක විස්තර ඇතුළත් වර්තමාන බැංකු ප්‍රකාශයක්

(ආ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් සඳහා ඃ

(i) ලියාපදිංචි සමාගමේ නම සහ ලියාපදිංචි අංකය ඃ
(ii) ලිපිනය ඃ
(iii) දුරකථන අංක ඃ

(අ) ස්ථාවර -
(ආ) ජංගම -
(ඇ) ෆැක්ස් -

(iv) විද්‍යුත් තැපෑල ඃ
(v) නෛතික/මුල්‍ය දත්ත ඃ

(අ) සමාගමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපත

(ආ) අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් පිළිබඳ විස්තර - (අමුණන්න)

සමාගම් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 1 වන ආකෘති පත්‍රයෙහි පිටපත (1 වන සහ 2 වන පිටු)

සමාගම් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 15 වන ආකෘති පත්‍රයෙහි පිටපත (අවසාන වාර්ෂික වාර්තාව)

සමාගම් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 20 වන ආකෘති පත්‍රයෙහි පිටපත (අදාළ වේ නම්)

සමාගම් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 13 වන ආකෘති පත්‍රයෙහි පිටපත

(ඇ) ප්‍රාග්ධන සම්පාදනය

(ඈ) සාංගමික ව්‍යවස්ථාවලිය -

(ඉ) පසුගිය තුන් වර්ෂයේ විගණනය කරන ලද වාර්ෂික වාර්තා. (අමුණන්න) -

(ඊ) යෝජිත ගවේෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන මූල්‍යමය හැකියාව ඔප්පුකරන සාක්ෂි. (අමුණන්න) -
වරලත් ගණකාධිකාරවරයකු විසින් සාදන ලද වර්තමාන මූල්‍ය ප්‍රකාශයක්
පසුගිය මාස 6ක විස්තර ඇතුළත් වර්තමාන බැංකු ප්‍රකාශයක්

(උ) කොටස් හිමිකාරිත්වය - දේශීය ...........% විදේශීය ..........%

(ඌ) කොටස් හිමියා සමාගමක් වේ නම්, පහත දැක්වෙන දෑ අමුණන්න ඃ

ලියාපදිංචි කිරීමේ සහතිකය/ සංස්ථාගත කළ රට අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් පිළිබඳ විස්තර ඃ-

1 වන ආකෘති පත්‍රයේ පිටපත (1 වන සහ 2 වන පිටු)

15 වන ආකෘති පත්‍රයේ පිටපත (අවසාන වාර්ෂික වාර්තාව)

2. ගවේෂණය කිරීමට අපේක්ෂා කරන ඛනිජ ද්‍රව්‍යවල නම් ඃ

3. තාක්ෂණික/වෘත්තීය දත්ත ඃ

(අ) ඉල්ලා සිටින ප්‍රදේශය මෙට්‍රික් ක්‍රමය අනුව හැඳින්වීම (1:50,000 පරිමාණයට අනුව ස්ථානය සහ මෙට්‍රික් ග්‍රිඩ් ඒකක අනුව හඳුනාගැනීමේ 2.3 වන ආකෘති පත්‍රය අමුණන්න)

(ආ) ව්‍යාපෘති කණ්ඩායමෙහි වෘත්තීය/තාක්ෂණික නිපුණත්වය (සියලුම කණ්ඩායම් සාමාජිකයන් පිළිබඳ සාරාංශ පත්‍ර අමුණන්න) -

4. බලපත්‍ර ගාස්තු රිසිට්පත (අමුණන්න) :

මේ ඉල්ලුම්පත්‍රයේ අන්තර්ගත ප්‍රකාශ, මාගේ උපරිම දැනීම අනුව සත්‍ය හා නිවැරදි බවත් 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග පිළිපැදීමට පොරොන්දු වන බවත්, මෙහි පහත අත්සන් කරන මම/අපි මෙයින් සහතික කරමි/කරමු. 1 වන අයිතමය හා 4 වන අයිතමය ද ඇතුළු ව අයිතම 1 සිට 4 දක්වා මෙහි සඳහන් කර ඇති ප්‍රකාශවල යම් වෙනසක් සිදුවුවහොත් එම වෙනස සිදුවී ලිත් දින දාහතරක් (14) ඇතුළත ඒ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැන්වීමට ද මම/අපි පොරොන්දු වෙමි/වෙමු.

.......................................
ඉල්ලුම්කරුගේ අත්සන

නම : -
තනතුර : -
දිනය : -

5. නිල රිසිට්පත/බලපත්‍රය ලැබෙන තෙක් :

(අ) බලය දෙන නිලධරයා -

(i) අත්සන හා දිනය : -
(ii) නම : -
(ii) තනතුර : -

(ආ) පරීක්ෂා කරන ලද්දේ : - ( ඉල්ලුම් පත්‍රය සඳහා අවසර ලබා දුන් දින සිට දින 45ක් ඇතුළත සම්පූර්ණ කළ යුතු ය)

(i) අත්සන හා දිනය : -
(ii) නම : -
(iii) තනතුර : -

---

<u>කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි</u>

ගවේෂණ බලපත්‍ර අංකය : -

ගවේෂණය සඳහා අවසර ලබාදුන් ප්‍රදේශය [වර්ග කිලෝමීටර්වලින් ($km^2$)] හෝ වර්ග කිලෝමීටර් එකකට වඩා අඩු වේ නම් වර්ග මීටරවලින් ($m^2$) : -

ඉල්ලුම්පත්‍රය අනුමත කරන ලදී/ ප්‍රතික්ෂේප කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල්වරයා

අත්සන හා දිනය : -

**(4(1) වන නියෝගය)**
**2.2 ආකෘති පත්‍රය**

**ගවේෂණ බලපත්‍රය**

(කාලය ඉකුත්වීමේ දිනට යටත් පිරිසෙයින් දින හැටකට (60) පෙරාතුව ඉදිරිපත් කළ යුතු අතර, මෙහි සපයා ඇති තොරතුරු බලපත්‍රය ක්‍රියාත්මක වන මාස දහයට (10) වඩා අඩු නොවිය යුතු ය.) (පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර සඳහා මසකට ඉල්ලුම්පත්‍ර ගාස්තුවෙන් 10% බැගින් වන අධිභාරයක් අයකරනු ලැබේ.)

**අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1. බලපත්‍ර අංකය : -
2. අලුත් කිරීමේ වර්ෂය :

පළමු ☐ දෙවන ☐ තෙවන ☐

(අදාල කොටුවේ ☐ ✓ (ලකුණ යොදන්න)

3. ඉල්ලුම්කරු පිළිබඳ විස්තර (වෙනස්කම් පමණි) :

(අ) තනි පුද්ගලයෙකු සඳහා :

(i) සම්පූර්ණ නම :

(ii) ජාතික හැඳුනුම්පත් අංකය :

(iii) ජාතිකත්වය :

(iv) උපන් දිනය හා වයස :

(v) ලිපිනය :

(vi) දුරකථන අංක :

(අ) ස්ථාවර :

(ආ) ජංගම :

(ඇ) ෆැක්ස් :

(vii) විද්‍යුත් තැපෑල :

(viii) වෘත්තිය :

(ix) රැකියාවක නියුක්ත වේ නම් රැකියාවේ තනතුර :

(x) සේවායෝජකයාගේ නම :

(xi) ලිපිනය :

(xii) දුරකථන අංක :

(අ) ස්ථාවර :

(ආ) ජංගම :

(ඇ) ෆැක්ස් :

(xiii) විද්‍යුත් තැපෑල :

(xiv) යෝජිත ගවේෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන මූල්‍යමය හැකියාව ඔප්පුකරන සාක්ෂි. (අමුණන්න) පසුගිය මාස 6ක විස්තර ඇතුළත් වර්තමාන බැංකු ප්‍රකාශයක්

(ආ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් සඳහා :

(i) ලියාපදිංචි සමාගමේ නම සහ ලියාපදිංචි අංකය :

(ii) ලිපිනය :

(iii) දුරකථන අංක :

(අ) ස්ථාවර :

(ආ) ජංගම :

(ඇ) ෆැක්ස් :

(iv) විද්‍යුත් තැපෑල :

(v) නෛතික/මූල්‍ය දත්ත :

(අ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපත -

(ආ) අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් පිළිබඳ විස්තර -
(අමුණන්න)
සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 1 වන ආකෘති පත්‍රයෙහි පිටපත (1 වන සහ 2 වන පිටු)
සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 15 වන ආකෘති පත්‍රයෙහි පිටපත (අවසාන වාර්ෂික වාර්තාව)
සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 20 වන ආකෘති පත්‍රයෙහි පිටපත (අදාළ වේ නම්)
සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 13 වන ආකෘති පත්‍රයෙහි පිටපත

(ඇ) ප්‍රාග්ධන සම්පාදනය -
(ඈ) සාංගමික ව්‍යවස්ථාවලිය -
(ඉ) පසුගිය තුන් වර්ෂයේ විගණනය කරන ලද වාර්ෂික වාර්තා (අමුණන්න)
(ඊ) යෝජිත ගවේෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන මූල්‍යමය හැකියාව ඔප්පුකරන සාක්ෂි (අමුණන්න)
වරලත් ගණකාධිකාරවරයකු විසින් සාදන ලද වර්තමාන මූල්‍ය ප්‍රකාශයක්
පසුගිය මාස 6 ක විස්තර ඇතුළත් වර්තමාන බැංකු ප්‍රකාශයක්

(උ) කොටස් හිමිකාරත්වය - දේශීය ................% විදේශීය ................%
(ඌ) කොටස් හිමියා සමාගමක් වේ නම්, පහත දැක්වෙන දෑ අමුණන්න :-
ලියාපදිංචි කිරීමේ සහතිකය / සංස්ථාගත කළ රට

අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් පිළිබඳ විස්තර :-

1 වන ආකෘතිපත්‍රයේ පිටපත (1වන සහ 2 වන පිටු)
15 වන ආකෘතිපත්‍රයේ පිටපත (අවසාන වාර්ෂික වාර්තාව)

4. තාක්ෂණික/ වෘත්තීය දත්ත :

(අ) අත්හැරීමට යෝජිත ප්‍රදේශය මෙට්‍රික් ක්‍රමය අනුව හැඳින්වීම (මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ඇතුළත් සිතියම අමුණන්න) -
(ආ) අත්නොහැර තබාගන්නා ප්‍රදේශය වර්ග කිලෝමීටර් වලින් හෝ වර්ග මීටර්වලින් මෙට්‍රික් ක්‍රමය අනුව හැඳින්වීම -
(ඇ) වෘත්තීය හෝ තාක්ෂණික කණ්ඩායම (අලුත් කණ්ඩායම් සාමාජිකයන් පිළිබඳ සාරාංශ පත්‍ර අමුණන්න) -

5. තාක්ෂණික වැඩ වාර්තාව (අමුණන්න) :

6. වැඩ වියදම :
(අ) අත්නොහැර තබාගන්නා ප්‍රදේශය මෙට්‍රික් ක්‍රමය අනුව හැඳින්වීම (මෙට්‍රික් ග්‍රිඩ් ඒකක ඇතුළත් සිතියම අමුණන්න) -
(ආ) තාක්ෂණික වැඩ වාර්තාවෙන් ලබාගත් පරිදි උපයනු ලබන තාක්ෂණික වැඩ බැරකම් -
(ඇ) ඉල්ලා සිටින ඒකක සඳහා හිමිකම් රඳවාගැනීමට අවශ්‍ය තාක්ෂණික වැඩ බැරකම් -
(ඈ) පවත්නා තාක්ෂණික වැඩ බැරකම් -
(ඉ) පවත්නා තාක්ෂණික වැඩ බැරකම්වල මුළු බැරකම් -
(ඊ) ඉදිරියට ගෙන ගිය තාක්ෂණික වැඩ බැරකම් -
(උ) තාක්ෂණික වැඩ බැරකම් ප්‍රමාණවත් නොවන අවස්ථාවක, හිඟය වෙනුවෙන් මුදලින් කරන ලද ගෙවීම -

7. බලපත්‍ර ගාස්තු රිසිට්පත (අමුණන්න) :

මේ ඉල්ලුම්පත්‍රයේ අන්තර්ගත ප්‍රකාශ, මාගේ උපරිම දැනීම අනුව සත්‍ය හා නිවැරදි බවත් 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග පිළිපැදීමට පොරොන්දුවන බවත්, මෙහි පහත අත්සන් කරන මම/අපි මෙයින් සහතික කරමි./ කරමු. 1 වන අයිතමය හා 4 වන අයිතමය ද ඇතුළුව අයිතම 1 සිට 4 දක්වා මෙහි සඳහන් කර ඇති ප්‍රකාශවල යම් වෙනසක් සිදුවුවහොත් එම වෙනස සිදුවී ලිත් දින දාහතරක් (14) ඇතුළත ඒ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැන්වීමට ද මම/අපි පොරොන්දු වෙමි/වෙමු.

......................................
ඉල්ලුම්කරුගේ අත්සන.

නම :-

තනතුරු:-

දිනය :-

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

(අ) බලපත්‍රයේ සියලුම නියම හා කොන්දේසි සපුරා ඇත/නැත. එම නිසා ඉල්ලා සිටින ප්‍රදේශය ................[වර්ග කිලෝමීටර් වලින් ($km^2$) හෝ වර්ග කිලෝමීටර් එකකට වඩා අඩු වේ නම් වර්ග මීටර් වලින් ($m^2$)] වැඩිදුර ගවේෂණය සඳහා නිර්දේශ කළ හැකි ය/කළ නොහැකි ය.

පරීක්ෂා කරන ලද්දේ :- (මේ ඉල්ලුම්පත්‍රය ලද දින සිට දින විසිඑකක් (21) ඇතුළත සම්පූර්ණ කළ යුතුය.)

(i) අත්සන හා දිනය :-
(ii) නම :-
(iii) තනතුර :-

(ආ) ඉල්ලුම් කළ පරිදි අලුත්කිරීම නිර්දේශ කරනු ලැබේ/කරනු නොලැබේ.
බලය දෙන නිලධරයා :-

(i) අත්සන හා දිනය :-
(ii) නම :-
(iii) තනතුර :-

(ඇ) අලුත් කිරීම සඳහා වන පළමුවන/දෙවන/තෙවන (අවසාන) ඉල්ලුම් පත්‍රය අනුමත කරන ලදී/ ප්‍රතික්ෂේප කරන ලදී.

**(4(1) වන නියෝගය)**
**9 වන ආකෘති පත්‍රය**

**ගවේෂණ බලපත්‍රය**
**ගවේෂණ ප්‍රතිසංස්කරණ ප්‍රගමන සැලැස්ම**

ගවේෂණ බලපත්‍ර අංකය :-
සෑම ගවේෂණ ප්‍රතිසංස්කරණ සැලැස්මක අදාළ පිඹුරු හා සිතියම් මගින් සනාථ කරනු ලබන පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

(1) යෝජිත වැඩබිමෙහි පිහිටීම සහ කැණීම් කටයුතු :
(2) සියලු කැණීම්වල ප්‍රමාණය සහ විස්තරය (අගල්,වල, ස්ට්‍රිපිං, ෂාෆ්ට්, ඩික්ලයින්, ඩිවෝටරිං යනාදිය)
(3) දැනට සැලසුම් කළ සියලු කැණීම් කටයුතු සහ ගන්ට් චාට් ලෙස ප්‍රතිසංස්කරණ කාර්යය :
(4) සියලු යෝජිත තාවකාලික ඉදිකිරීම් පිළිබඳ විස්තර සපයන්න :
(5) (අ) කැණීම් සඳහා :
(ආ) කැඩුම් බිඳුම් වශයෙන් :
(ඇ) ඉදිකිරීම් සඳහා :
(ඈ) බැහැර කිරීම සඳහා :
යොදා ගැනීමට නියමිත සියලු ද්‍රව්‍ය පිළිබඳ විස්තරය :
(6) ඉහත (3) වන ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි නිශ්චිත කාල සීමාව ඇතුළත අනුක්‍රමික කළ යුතු ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තුගත වියදම් :
(7) මූල්‍යමය කාර්ය සාධනය පිළිබඳ ඇපකරය :
(8) ප්‍රගමන ගවේශණයට යටත් ප්‍රදේශයේ සිතියම :

සටහන :- ''ගවේෂණ ප්‍රතිසංස්කරණ ප්‍රගමන සැලැස්ම - තත්ත්වය සහ යාවත්කාලීන කිරීම'' අදාළ වන අවස්ථාවන්හි එක් එක් වාර්ෂික තාක්ෂණික වැඩ වාර්තාවෙහි (IIවන ආකෘති පත්‍රය) අවශ්‍ය කොටසක් ලෙස ඇතුළත් විය යුතුය.

(8) 2.3 වන ආකෘති පත්‍රයට ඉක්බිතිව ම පහත දැක්වෙන ආකෘති පත්‍රය ඇතුළත් කිරීමෙන් :-

(4(1) වන නියෝගය)

2.4 වන ආකෘති පත්‍රය

ගවේෂණ බලපත්‍රය

පැවරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය

1. බලපත්‍ර අංකය :
2. පැවරුම්කරුගේ නම :
3. පැවරුම්ලාභියා පිළිබඳ තොරතුරු :

(අ) තනි පුද්ගලයකු සඳහා

(i) ඉල්ලුම්කරුගේ/ බලයලත් අනුයෝජිතයාගේ නම :

(ii) ලිපිනය :

(iii) ජාතිකත්වය :

(iv) වෘත්තිය :

(v) ශ්‍රී ලංකාවෙහි,

(අ) ව්‍යාපාර ස්ථානය -

(ආ) පදිංචිය -

(vi) යෝජිත ගවේෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන මූල්‍යමය හැකියාව ඔප්පු කරන සාක්ෂි. (අමුණන්න) පසුගිය මාස 6ක විස්තර ඇතුළත් වර්තමාන බැංකු ප්‍රකාශයක්.

(ආ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් සඳහා :

(i) ලියාපදිංචි සමාගමේ නම සහ ලියාපදිංචි අංකය :

(ii) ලිපිනය :

(iii) දුරකථන අංක :

(අ) ස්ථාවර -

(ආ) ජංගම -

(ඇ) ෆැක්ස් -

(vi) විද්‍යුත්-තැපැල :

(v) නෛතික/මුල්‍ය දත්ත :

(අ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපත

(ආ) අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් පිළිබඳ විස්තර - අමුණන්න.

සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද (1) වන ආකෘති පත්‍රයෙහි පිටපත (1 වන සහ 2 වන පිටු)

සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 15 වන ආකෘති පත්‍රයෙහි පිටපත (අවසාන වාර්ෂික වාර්තාව)

සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 20 වන ආකෘති පත්‍රයෙහි පිටපත (අදාළ වේ නම්)

සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද 13 වන ආකෘති පත්‍රයෙහි පිටපත

(vi) ප්‍රාග්ධන සම්පාදනය :

(vii) සාංගමික ව්‍යාවස්ථාවලිය :

(viii) පසුගිය තුන් වර්ෂයේ විගණනය කරන ලද වාර්ෂික වාර්තා (අමුණන්න) :

(ix) යෝජිත ගවේෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන මූල්‍යමය හැකියාව ඔප්පුකරන සාක්ෂි. (අමුණන්න)
වරලත් ගණකාධිකාරිවරයකු විසින් සාදනු ලබන වර්තමාන මූල්‍ය ප්‍රකාශයක්
පසුගිය මාස 6ක විස්තර ඇතුළත් වර්තමාන බැංකු ප්‍රකාශයක්

(x) කොටස් හිමිකාරත්වය - දේශීය ..............% විදේශීය .............%

(xi) කොටස් හිමියා සමාගමක් වේ නම්, පහත දැක්වෙන දෑ අමුණන්න :
ලියාපදිංචි කිරීමේ සහතිකය / සංස්ථාගත කළ රට
අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් පිළිබඳ විස්තර :
1 වන ආකෘති පත්‍රයේ පිටපත (1 වන සහ 2 වන පිටු)
15 වන ආකෘති පත්‍රයේ පිටපත (අවසාන වාර්ෂික වාර්තාව)

4. තාක්ෂණික / වෘත්තීය දත්ත :

(අ) ඉල්ලා සිටින ප්‍රදේශය මෙට්‍රික් ක්‍රමය අනුව හැඳින්වීම (1:50,000 ස්ථාන නිශ්චයන සිතියම සහ මෙට්‍රික් ග්‍රිඩ් ඒකක අනුව හඳුනාගැනීමේ 2.3 වන ආකෘති පත්‍රය අමුණන්න.)

(ආ) ව්‍යාපෘති කණ්ඩායමෙහි වෘත්තීය/තාක්ෂණික සහතික පත්‍ර (අමුණන්න)

(ඇ) ව්‍යාපෘති යෝජනාව

5. පැවරීමට හේතුව :

6. පැවරීමේ නියම හා කොන්දේසි :

7. බලපත්‍ර ගාස්තු රිසිට්පත (අමුණන්න) :

මෙම ඉල්ලුම්පත්‍රයේ ඇතුළත් ප්‍රකාශ, මාගේ උපරිම දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව මෙහි පහත අත්සන් කරන මා විසින් සහතික කරන අතර 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග පිළිපැදීමට මම පොරොන්දු වෙමි.

සාක්ෂි :

............................
අත්සන
(පැවරුම්ලාභියා)

---

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය :

දිනය :

............................
අත්සන
(අධ්‍යක්ෂ ජනරාල්)"

EOG 01-0014

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.